# <u>තරග ඉසව් - සංගීත</u>

## 01.ශාස්ත්‍රීය ඒකල ගායන රාගධාරී - පිරිමි

**නිර්දේශිත රාගය - යමන්**

## 02. ශාස්ත්‍රීය ඒකල ගායන රාගධාරී - ගැහැණු

**නිර්දේශිත රාගය - භිම්පලාශ්‍රී**

**තරග අංක 01 හා 02 ශීර්ෂ සඳහා කොන්දේසි**

I. මෙම රාගයකට අයත් හින්දි බසින් රචිත විලම්භලය සහ මධ්‍යලයට අයත් ඛ්‍යාල් ශෛලියේ ගීත 02ක් ඇතුලත් විය යුතුය.
II. ශාස්ත්‍රීය ගායන ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුයි.
III. වෙනත් ගායන ශෛලීන්වලට අයත් අංග මිශ්‍ර කළ නොහැකියි.
IV. කාලය අවම විනාඩි 06කි. උපරිමය විනාඩි 08 කි.
V. සහභාගී විය හැකි සංඛ්‍යාව තරගකරු හැර සහය වාදකයින් උපරිම සංඛ්‍යාව 04 කි.

## 03.ශාස්ත්‍රීය රාගධාරී ඒකල වාදන - පිරිමි

**නිර්දේශිත රාගය - බහාර්**

## 04.ශාස්ත්‍රීය ඒකල වාදන - ගැහැණු

**නිර්දේශිත රාගය - දේශ්**

**තරග අංක 03 හා 04 ශීර්ෂ සඳහා කොන්දේසි**

I. විලම්භලය මධ්‍යලය හා ද්‍රැතලය වාදිත ඇතුලත් කර ගත හැකිය. ( විලම්භලය වාදනයක් අනිවාර්ය වේ. )
II. ශාස්ත්‍රීය ඒකල වාදන ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුයි.
III. නිවැරදි ඉරියව් සහ හස්ත සාධනය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.
IV. කාලය අවම විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.
V. සහය වාදනය සඳහා ඉදිරිපත් විය හැක්කේ උපරිම සංඛ්‍යාව 04 කි.
VI. නිර්දේශිත භාණ්ඩ (වයලින්, සිතාර්, බටනලා, එස්රාජ්, දිල්රුබ්, සරෝද්, සාරංගී, බොක්ස් ගිටාර්, මැන්ඩලින්,මෝහන්වීනා,සන්තූර් )

## 05. ශාස්ත්‍රීය ඒකල වාදන - (තබ්ලා)

**නිර්දේශිත තාලය - ඣප් තාල්**

I. සහය වාදනය සඳහා සහභාගී විය හැකි සංඛ්‍යාව උපරිම 02 කි.
II. කාලය අවම විනාඩි 06 කි. උපරිම විනාඩි 08 කි.

III. ශාස්ත්‍රීය ඒකල තබ්ලා වාදන ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුය.
IV. ලෙහෙරා වාදනයත් සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

## 06.ශාස්ත්‍රීය සමූහ ගායන

### නිර්දේශිත රාගය - හංසධ්වනි

I. හින්දි බසින් රචිත මධ්‍යලය ඛ්‍යාල් ගීතයක් විය යුතුය.
II. ඛ්‍යාල් ගායනයට අයත් ශාස්ත්‍රීය ආකෘතියට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.
III. වෙනත් ගායන ශෛලීන්වලට අයත් අංග මිශ්‍ර නොකළ යුතුය.
IV. සමූහ ගායන අංග මගින් විචිත්‍රවත් කර ගත හැකිය.
V. කාලය අවම විනාඩි 06කි. උපරිමය විනාඩි 08 කි.
VI. ගායනය සඳහා සහභාගී විය හැකි සංඛ්‍යාව අවම 06 කි. උපරිම සංඛ්‍යාව 10 කි.
වාදක මණ්ඩලය සඳහා සහභාගීවිය හැකි සංඛ්‍යාව උපරිම 05 කි.

## 07.ශාස්ත්‍රීය රාගධාරී සමූහ වාදනය

### නිර්දේශිත රාගය - ශිවරංජනි

i. මධ්‍යලය, දෘතලය වාදිත ඇතුලත් කර ගත යුතුය.
ii. ශාස්ත්‍රීය වාදන ආකෘතියට අනුකූල විය යුතුය.
iii. සමූහ වාදන අංග යොදා ගැනීමෙන් විචිත්‍ර කර ගත හැකිය.
iv. නිවැරදි ඉරියව් සහ ශිල්පීය ක්‍රම අනුගමනය කළ යුතුය.
v. සහභාගී විය හැකි සංඛ්‍යාව වාදක මණ්ඩලය හසුරුවන්නා ඇතුළුව අවමය 12 කි. උපරිමය 15 කි.
vi. කාලය අවම විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.
vii. භාවිත කළ හැකි භාණ්ඩ(වයලීන්,සිතාර්,එස්රාජ්,බටනලා, දිල්රුබා,සරෝද්,සාරංගි, බොක්ස් ගිටාර්,මෝහන්වීනා ,සන්තූර්,මැන්ඩලීන්,තබ්ලා, පඛාවාජ්, තාම්පුරා, ඉලෙක්ට්‍රොනික් තාම්පුරා, ස්වර මණ්ඩල, හාමෝනියම්)

## 08.ජන ගායන ඒකල - පිරිමි (අවු 15 - 23)

i. සීපද සහ ශාන්ති කර්ම යන ගායන ශෛලීන් දෙකටම අයත්ව ගායන තෝරා ගත යුතුයි.
ii. දේශීය අවනද්ධ භාණ්ඩ හා ඝන වාද්‍ය භාණ්ඩ පමණක් සහය වාදනය සඳහා යොදා ගත හැකිය.
iii. ගායනය ශෛලීන්ට උචිත අංගචලන,රංග භාණ්ඩ භාවිත කළ හැකිය.
iv. කාලය අවම විනාඩි 03 කි. උපරිමය විනාඩි 05 කි.

## 09.ජන ගායන ඒකල - ගැහැනු (අවු 15 - 23)

i. වැලපුම් සහ රබන් ගායන ශෛලීන් දෙකටම අයත් වන පරිදි ගායන තෝරා ගත යුතුයි.
ii. දේශීය අවනද්ධ භාණ්ඩ හා ඝන වාද්‍ය භාණ්ඩ පමණක් සහය වාදනය සඳහා යොදා ගත හැකිය.
iii. ගායන ශෛලීන්ට උචිත රංග භාණ්ඩ සහ අංග චලන යොදා ගත හැකිය.
iv. කාලය අවම විනාඩි 03 කි. උපරිමය විනාඩි 05 කි.

## 10. ජන ගායන සමූහ (අවු: 12 – 23)

i. නෙලුම්, ගොයම්,කමත්,කුළු යන ගායන ශෛලීන් අතුරින් අවම ගායන ශෛලීන් තුනක් භාවිත කළ යුතුය.
ii. විද්‍යුත් නොවන ඕනෑම වාද්‍ය භාණ්ඩයක් මේ සඳහා යොදා ගත හැකිය.
iii. ගායනයට හානි නොවන පරිදි අංග චලන සහ උචිත ඇඳුම් පැළඳුම් භාවිත කළ හැකි වේ.
II. ගායනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 10 ක් වන අතර වාදක මණ්ඩලයත් සමඟ සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 15 කට නොවැඩි විය යුතුය.
III. කාලය අවම විනාඩි 05 ක් වන අතර උපරිමය විනාඩි 07 කි.

## 11.සමූහ ගායනය ( ස්වතන්ත්‍ර නිර්මාණ ) අවු.12න් පහළ

i. **"සුවෙන් සිටිමු රටක් රකිමු "** යන තේමාව යටතේ ළමා මනසට උචිත ස්වතන්ත්‍ර නිර්මාණයක් ඉදිරිපත් කළ යුතුය.
ii. ගායනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 08 ක් වන අතර වාදක කණ්ඩායම සමඟ උපරිම සංඛ්‍යාව 15 කි.
iii. ඕනෑම වාද්‍ය භාණ්ඩයක් භාවිත කළ හැකිය.
iv. කාලය අවම විනාඩි 03 ක් වන අතර උපරිමය විනාඩි 05 කි.

## 12. ළමා ගීත ඒකල - (අවු 12 න් පහළ ගැහැනු / පිරිමි )

**නිර්දේශිත ගීත :**

- සීනි කෝපි තේ කිරි තේ (සීනිබෝල හෝටලේ)
- අපෙ අම්මා කොළඹ ගිහිල්ලා

i. ඉහත ගීත අතුරින් ගායනා කළ හැක්කේ එක් ගීතයක් පමණි.
ii. පෙරවාදන, අතුරුවාදන ආදී ශිල්පාංග සමඟින් මුල් නාද මාලාවට හානි නොවන පරිදි ගායනය ඉදිරිපත් කළ යුතුය.
iii. ඕනෑම වාද්‍ය භාණ්ඩයක් මේ සඳහා යොදා ගත හැකිය.
iv. ගායනයට හානි නොවන පරිදි අංග චලන යොදා ගත්තාට වරදක් නැත.
v. සහය වාදනයට සහභාගී විය හැකි සංඛ්‍යාව තරගකරු හැර උපරිමය 08 කි.
vi. විදුලි ඕගනය භාවිත කරන්නේ නම් කලින් සකස් කරන ලද සංගීත ඛණ්ඩ භාවිත කළ නොහැකි අතර, සජීවීව වාදනය කළ යුතුයි.

## 13.නව නිර්මාණ ගී (සමූහ)

i. **" සුරකිමු අපි වන සම්පත "** යන මාතෘකාව තේමාකොට ගත් රචනාවක් විය යුතුයි.
ii. ගායනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 10 ක් වන අතර, වාදක මණ්ඩලයත් සමඟ සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 15 කි.
iii. කාලය අවම විනාඩි 03 ක් වන අතර උපරිමය විනාඩි 05 කි.
iv. ඕනෑම වාද්‍ය භාණ්ඩයක් මේ සඳහා යොදා ගත හැකිය.

විදුලි ඕගනය භාවිත කරන්නේ නම් කලින් සකස් කරන ලද සංගීත ඛණ්ඩ භාවිත කළ නොහැකි අතර, සජීවීව වාදනය කළ යුතුය.

**සැ.යු.**

- කිසියම් ආගමකට ජන කොටසකට හෝ දේශීයත්වයට හානිකර හා ප්‍රකෝපකාරී හැඟීම් දනවන එමෙන්ම දේශපාලනික වශයෙන් කිසියම් පක්ෂයක මතවාද කුලු ගැන්වෙන පද රචනා ඍජුව හෝ වක්‍රව හෝ යොදා ගැනීම සපුරා තහනම් වේ.

- තරග අංකය ඉදිරිපත් කිරීමට පෙර නව නිර්මාණයට පාදක කරගත් පදරචනය සහ සංගීත රචනය විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 14.නූර්ති ගී - ඒකල (ගැහැණු )

**නිර්දේශිත ගීත**

- වෙස්සන්තර
- ශ්‍රී වික්‍රම

I. ඉහත නූර්තියකට අයත් ගීතයක් ගායනා කළ යුතුය.
II. සහය වාදනය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
III. විද්‍යුත් භාණ්ඩ භාවිත කළ නොහැක.
IV. ගායනයට උචිත වන පරිදි ඇඳුම් සහ අංග චලන භාවිත කළ හැකිය.

## 15. නාඩගම් ගී - (ඒකල පිරිමි )

**නිර්දේශිත ගීත**

- ලියනෝරා
- බ්‍රම්පෝට්

i. ඉහත නාඩගමකට අයත් ගීතයක් ගායනා කළ යුතුය.
ii. සහය වාදනය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
iii. විද්‍යුත් භාණ්ඩ භාවිත කළ නොහැක.
iv. ගායනයට උචිත වන පරිදි ඇඳුම් සහ අංග චලන භාවිත කළ හැකිය.

සිරිසෝම ලොකුවිතාන
ලේකම්,
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.